කො/දේවි බාලිකා විද්‍යාලය - කොළඹ

පළමු වාර පරීක්ෂණය - 2016 (මාර්තු)

ඉතිහාසය, භූගෝලය, පුරවැසි අධ්‍යයනය

7 ශ්‍රේණිය

කාලය පැය 1 1/2 යි

## ඉතිහාසය

### 1-කොටස

01) හිස්තැනට වඩාත් සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

1. කැලෑ ගිනි තබා එළිපෙහෙළිකර සකස් කර ගන්නා බිමක් ............................ නමින් හැඳින්වේ.
2. ................................... ශිලා ලිපියේ අකලහස, මදහස හා පිට දඩහස යනුවෙන් කන්න තුනක් පැවති බව සඳහන් වේ.
3. අතීතයේ දී පේෂකර්මාන්තයේ යෙදී සිටි ශිල්පීන් ................................ නමින් හඳුන්වා ඇත.
4. සූප ශාස්ත්‍රයට දක්ෂ කාන්තාවන් .................................. යනුවෙන් මූලාශ්‍රයෙහි සඳහන් කර තිබේ.

(හේන , කුඹුර , කුම්බකාර , බදුලු , තෝනිගල , මධුපාචිකා , පූග , ස්වර්ණකාර, නානාදේසි , පෙහෙකාර)

02) නිවැරදි පිළිතුර තෝරා වරහන් තුළ ලියන්න.

1. ස්වභාවික වරායක් වූ ගෝකණ්ණ වරාය පිහිටා තිබූ ස්ථානය වර්තමානයේ හඳුන්වන්නේ කුමන නමකින්ද ?
   - i. මන්නාරම
   - ii. ත්‍රිකුණාමලය
   - iii. හම්බන්තොට
   - iv. කොළඹ

   (.........)
2. මානවම්ම කුමාරයාට පෙර අනුරාධපුරය පාලනය කළ රජතුමා කවුද ?
   - i. දාඨෝපතිස්ස රජු
   - ii. 1 වන සේන රජු
   - iii. හත්ථදාඨ රජු
   - iv. ධාතුසේන රජු

   (.........)
3. මානවම්ම කුමාරයාට සහය දුන් දකුණු ඉන්දියානු පාලකයා කවරෙක්ද ?
   - i. 1 වන නරසිංහවර්මන්
   - ii. 11 වන වරගුණවර්මන්
   - iii. 1 වන රාජේන්ද්‍ර
   - iv. රාජ රාජ

   (.........)
4. ශ්‍රී මාර ශ්‍රී වල්ලභ නම් පාණ්ඩ්‍ය රජු ලංකාව ආක්‍රමණය කරන විට ලංකාවේ සිටි පාලකයා කවරෙක්ද?
   - i. 11 දප්පුල රජු
   - ii. 1 සේන රජු
   - iii. 11 සේන රජු
   - iv. මානවම්ම රජු

   (.........)

### 2 - කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

1. අභ්‍යන්තර වෙළෙඳාමේදී වැදගත් වූ වෙළෙඳ නගර 2 ක් නම් කරන්න. (ලකුණු 2)
2. අතීතයේදී හේන් වගාවේ පැවති විශේෂ ලක්ෂණ 4 ක් සඳහන් කරන්න. (ලකුණු 4)
3. අතීතයේදී මඩගොවිතැනේ පැවති විශේෂ ලක්ෂණ 4 ක් සඳහන් කරන්න. (ලකුණු 4)
4. අපේ සංස්කෘතිය යනු කුමක්ද ? (ලකුණු 4)
5. අන්‍යෝන්‍ය සහයෝගය යනු කුමක්ද ? අතීත ලාංකිකයන් සාමුහිකව කළ ක්‍රියාවන් මොනවාද ? (ලකුණු 3)
6. සිරිත් විරිත් යනු මොනවාද ? එයට උදාහරණ 4 ක් දක්වන්න. (ලකුණු 5)